# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් ද සමඟ recruitment@pgim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට 2026.04.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ යොමු කළ යුතුය. අයදුම් කරන තනතුර විද්‍යුත් තැපැලේ විෂයය හි පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සහ වැඩිදුර විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියෙන් (https://pgim.cmb.ac.lk) ලබා ගත හැක. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කරන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

සුදුසුකම් සහ පළපුරුද්ද තහවුරු කරන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් ඇතුළුව අවශ්‍ය තොරතුරු නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාද වී යොමු කරන අයදුම්පත් භාරගනු නොලැබෙන අතර, ප්‍රතික්ෂේපිත අයදුම්පත් කිසිදු තත්ත්වයක් යටතේ නැවත සලකා බලනු නොලැබේ.

## 01. රියදුරු තනතුර (III ශ්‍රේණිය) - තනතුරු 01 යි

**සුදුසුකම්:**

1. උපරිම වාර දෙකකදී අවම, වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

සහ

2. බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබීම.

**වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වෙනත් :** සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.
iii. විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**තෝරා ගැනීම** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ වෘත්තීය පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : 2025.01.01 දිනට මසකට රු. 48,005 - 16X490 - 55,845 [U PL 3(III)]

## 02. පුස්තකාල තොරතුරු සහකාර තනතුර (III ශ්‍රේණිය) - තනතුරු 01 යි

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ පහත විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම:
   i. සිංහල භාෂාව / දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

සහ

2. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් එක් වරකදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (මෙම කාර්යය සඳහා පැරණි නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් 3 කින් සමත් වීම ප්‍රමාණවත් වේ.)

❖ පහත සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ:

අ) පිළිගත් ආයතනයකින් ලබාගත් පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශිෂ්‍ය භාවය හෝ අර්ධ/පූර්ණ සුදුසුකම්.

සහ

ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පරිගණක යෙදුම් (computer applications) පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්.

**වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය** : 2025.04.01 දිනට මසකට රු. 49,475 - 17X540 - 58,655 [U MN 1(III)]

**අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**27.03.2026**